සංක්ෂේපයෙන් ............

බෞද්ධයන්ගේ හස්තසාර වස්තුවක් ලෙස සැළකෙන ධම්මපදයෙහි අඩංගු මාර්ගෝපදේශන හා උපදේශන සංකල්ප ශ්‍රී ලංකාවේ නව යොවුන්වියේ සිසුන්ගේ චරිත සංවර්ධනය සඳහා කෙසේ අදාළ කරගත හැකිදැයි විමසා බැලීම මෙම පර්යේෂණ අධ්‍යයනය මගින් සිදුකොට ඇත. වත්මන් පාසැල් පද්ධතිය තුළ මාර්ගෝපදේශන හා උපදේශන සේවා ව්‍යාප්ත වී යන මෙම අවධියේ ආගමික අධ්‍යාපනය මුල්කොට ගත් උපදේශන සංකල්ප ප්‍රායෝගිකව යොදා ගැනීම පිළිබඳ අධ්‍යයනයක් කිරීම කාලීන වශයෙන්ද වැදගත්කමක් උසුළයි. පංචශීලය පාදක කොටගත් චර්යා ධර්ම පාසැල් වියේ සිටම දරුවන් තුළ ප්‍රගුණ කිරීම බුද්ධ ධර්මය විෂයය තුළින් අපේක්‍ෂා කරන අතර හයවන වසරේ සිටම ධම්මපද ගාථා ඇතුලත් කොට එම විෂය නිර්දේශය සකස්කොට තිබීම වැදගත්ය.

මෙම අධ්‍යයනයේදී අවධාරණය කොට ඇත්තේ වයස අවුරුදු 11-20 අතර පමණ වන කනිෂ්ඨ ද්විතීයක හා ජ්‍යෙෂ්ඨ ද්විතීයක මට්ටම්වල ඉගෙනුම ලබන ශ්‍රී ලංකාවේ නව යොවුන්වියේ සිසුන්ගේ චරිත සංවර්ධනයට ධම්මපදයේ අඩංගු උපදේශන සංකල්ප කෙසේ අදාළ කරගත හැකිද යන්නයි. එම නිසා විවිධ මනෝවිද්‍යාඥයන් විසින් ඉදිරිපත්කොට ඇති නව යොවුන්විය පිළිබඳව සීමා මෙහිදී සළකා නොබැලේ.

පුද්ගල චරිත සංවර්ධනය සඳහා බුදුන්වහන්සේගේ දේශනා තුළින් ලැබිය හැකි මාර්ගෝපදේශනය හා උපදේශනය කෙබඳුදැයි විවිධ කෘතීන්හි ඇතුළත් අදහස් මෙම නිබන්ධනයේ සාහිත්‍ය විමර්ශනය තුළින් ඉදිරිපත් කොට ඇත. ආධ්‍යාත්මික ගුණවගාව හා චරිත සංවර්ධනයට පාදකවන ධම්මපද උපදේශන සංකල්ප නව යොවුන් සිසුන්ගේ කාය සංවරය, වචී සංවරය හා මනෝ සංවරය (චිත්ත සංවරය) යන ප්‍රධාන ක්‍ෂේත්‍ර පිළිබඳව හතරවන පරිච්ඡේදය මගින් සාකච්ඡා කොට ඇති අතර පස්වන පරිච්ඡේදයේ ප්‍රතිඵල සමාලෝචනය හා නිගමන යටතේද චරිත සංවර්ධනය පිළිබඳ ඉහත දැක්වූ අංශත්‍රයේ වැදගත් කරුණු ඇතැම් තැන නැවත මතුකර දැක්වේ.

ධම්මපදයේ සඳහන් වර්ග විසිහයට අයත් ගාථා හාරසිය විසිතුන අතරින් කාය සංවරය, වචී සංවරය හා මනෝ සංවරය යන අංශ තුන පිළිබඳව උපදේශන කාර්යයට වඩා සුදුසු ගාථා ධර්ම 90 ක් තෝරාගෙන විමසීමට ලක්කොට ඇත. සුබෝච්චාරණය පිණිස ගාථාවල බොහොමයක් පාලි වචන ගල්කොට දක්වා ඇති අතර සෑම ගාථාවකම සරල සිංහල අර්ථයද දී තිබේ. ඇතැම් ගාථා සම්බන්ධව අර්ථෝත්පත්ති කථා ඉදිරිපත් කරමින් නව යොවුන් උපදේශනයේදී එම අදාළ උපදේශන සංකල්ප යොදා ගත හැකි අයුරු ප්‍රතියමාන කිරීමට යත්න දරා ඇත. නව යොවුන් ශිෂ්‍ය උපදේශනය සඳහා තෝරාගෙන විමර්ශනයට භාජනය කොට ඇති එම ගාථා ධර්ම පිරිවෙන්වල ඉගෙනුම ලබන නව යොවුන් සාමණේර භික්ෂූන්ගේ චරිත සංවර්ධනය සඳහා ද එකසේ අදාළ කරගත හැකිය.